42891

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

**නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II**
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.**

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A
ඇසුවන් නිවැරදි තම හිමියන්නේ
සිටිමින් පත්තිනි බල පාමින්නේ
ඉතිකින් නැත අප වරද බොලන්නේ
යමු දැන් පඬි පුරයට අපි දෙන්නේ

B
අණබෙර කාරයෙක් - සමග එන හේවායෙක්
යුද සෙබළ දෙදෙනෙක් සමග ලන්දේසි යුවලක්

C
දන්න වං හුං අප කන්න සාමි රාජ ධූරයේ
රාජ ධූර රාජ ධූර රාජ ධූරයේ
රකී බුද්ධ ධර්ම සීල පූර්වේ රජුන් ලෙසේ
අධර්මිෂ්ඨ නීච ක්‍රියා යයි මැකී ළයේ

D
ඈත කඳුකර හිමව් අරණේ – සීත චන්දන ළපලු සෙවනේ
සුළං රැල්ලේ පාව එන්නේ – ඔහුගේ නාමය වේ

E
රුවිනා පුන් සඳසෙ බබළනා – සිරියා කොමළියෙ
රැගෙනා දැන් බලනු මෙහසුනා
ගම්බිර මගෙ පිය නරවර – ගෙන් මෙහසුන ලැබුණි මෙමට
පෙම්බරයෙනි මෙනුවර හැර – යන්නට සිදු විය පියපුර

**1.** කෝලම් ජන නාටකය හා සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**2.** නූර්ති නාට්‍යයක් හා සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

**3.** මද්දලය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරමින් ගායනා කරන ලද්දේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**4.** මහගමසේකර විසින් රචනා කරන ලද්දේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

[දෙවැනි පිටුව බලන්න.

**5.** ප්‍රාසංගික කලා පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) ගුවන්විදුලි නාට්‍ය, චිත්‍රපට, වේදිකා නාට්‍ය, බැලේ
(2) ගීත නාට්‍ය, ඔපෙරා, බැලේ, නර්තනය
(3) අභිරූපණ රංග, ගායනය, ටෙලි නාට්‍ය, වේදිකා නාට්‍ය
(4) ඔපෙරා, මුද්‍රා නාට්‍ය, චිත්‍ර, වාදනය

**6.** නෘත්‍ය යනුවෙන් අදහස් කරන්නේ
(1) කිසියම් අර්ථයක් හෝ භාවයක් නිරූපණය කරන නර්තනයකි.
(2) අංග වික්ෂේප භාවිත කර රිද්මයානුකූල ව හා ශෝභමාන ව සිදුකරන නැටුමකි.
(3) අර්ථ විරහිත ව සිදු කරනු ලබන නර්තනයකි.
(4) සතර අභිනය භාවිත කර සිදු කරනු ලබන රැඟුමකි.

**7.** නාට්‍යශාස්ත්‍ර ග්‍රන්ථයේ කර්තෘත්වය හිමි වන්නේ කාට ද?
(1) භරතමුනි (2) අභිනවගුප්ත (3) නන්දිකේශ්වර (4) ධනංජය

**8.** අඳුරු වේදිකාවේ එක් චරිතයක් කෙරෙහි පමණක් ප්‍රේක්ෂකයා ගේ අවධානය යොමු කරවීම් පිණිස යොදාගනු ලබන ආලෝක පහන කුමක් ද?
(1) ධාරාලෝක පහන (2) යොමු පහන
(3) හැලජන් පහන (4) අල්ට්‍රා වයලට් පහන

**9.** පින්තූර රාමු වේදිකාව මනඃකල්පිත ලෙස කොටස් නවයකට බෙදීම වඩාත් ප්‍රයෝජනවත් වන්නේ
(1) පසුතල නිර්මාණ ශිල්පීන්ට, අධ්‍යක්ෂවරයාට සහ ප්‍රේක්ෂකයාට ය.
(2) නිෂ්පාදකවරයාට, රංගන ශිල්පීන්ට සහ ප්‍රේක්ෂකයාට ය.
(3) නාට්‍ය රචකයාට, ආනුෂංගික ශිල්පීන්ට සහ රංගන ශිල්පීන්ට ය.
(4) රංගන ශිල්පීන්ට, අධ්‍යක්ෂවරයාට සහ රංගාලෝක ශිල්පීන්ට ය.

**10.** රූපණ ශිල්පියකු පෙර පුහුණුවීම්වල දී බිම වැතිරී දෑස් පියා සංගීත ඛණ්ඩයකට සවන් දෙමින් මානසික සැහැල්ලුව ලබා ගැනීම
(1) පරිකල්පන අභ්‍යාසයකි. (2) ශ්වසන අභ්‍යාසයකි.
(3) ශිථිලකරණ අභ්‍යාසයකි. (4) සංවේදන අභ්‍යාසයකි.

**11.** නවක රූපණ ශිල්පියකුට කටහඬ පුහුණු අභ්‍යාස සඳහා වඩාත් සුදුසු ග්‍රන්ථ ත්‍රිත්වය වන්නේ
(1) වදන්කවි පොත, සුභාෂිතය සහ නම්පොත ය.
(2) පිරුවානා පොත, බුද්ධ ගජ්ජය සහ සකස්කඩ ය.
(3) සකස්කඩ, බුද්ධ ගජ්ජය සහ නම්පොත ය.
(4) ජාතක පොත, භගවත් ගීතාව සහ බුද්ධ ගජ්ජය ය.

**12.** නාට්‍යයක ඒකාකාරී ගලායාම වෙනස් කර ප්‍රබල අරුතක් සහිත දෘශ්‍ය රූපයක් මැවීමට උපකාරී වන්නේ
(1) අංග රචනය යි. (2) රංග රචනය යි.
(3) නාට්‍ය සංගීතය යි. (4) රංගාලෝකය යි.

**13.** නර්තනානුකූල රංග වින්‍යාසයක් යොදාගත් අවස්ථාවකට නිදසුනක් වන්නේ
(1) හුණුවටයේ කතාව නාට්‍යයේ ග්‍රූෂා වැල්පාලමේ යන ආකාරය ය.
(2) මනමේ නාට්‍යයේ මනමේ කුමරු හා වැදි රජු අතර සටන ය.
(3) කුවේණි නාට්‍යයේ ජීවහත්ථ හා දිසාලා සමග දඩයක්කරු හමු වන මොහොත ය.
(4) කදා වළලු නාට්‍යයේ කච්ඡපුට වෙළෙන්දා ගෙන් වළලු මිල දී ගැනීම ය.

**14.** රංගභූමි අලංකරණය යන්න නිවැරදි ව දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.
(1) දර්ශනයට උචිත වන පරිදි වේදිකාව සකස් කිරීම
(2) තිර රෙදි පමණක් යොදා වේදිකාව සකස් කිරීම
(3) දෙබස්වලින් මවන පරිසරයට අනුව වේදිකාව සැකසීම
(4) වේදිකාව විචිත්‍ර වර්ණවලින් සැරසීම

**15.** කරදිය මුද්‍රා නාට්‍යයට සංගීතය සැපයූ සංගීතඥයා කවුද?
(1) ඩබ්ලිව්. ඩී. අමරදේව (2) ප්‍රේමසිරි කේමදාස
(3) සෝමදාස ඇල්විටිගල (4) ඩබ්ලිව්. බී. මකුලොලුව

**16.** නාට්‍යයක්, කතාන්දරයකින් වෙනස් වන එක් ලක්ෂණයක් වන්නේ
(1) සිද්ධි මාලාවක් අනුපිළිවෙළින් රචනා කිරීම යි.
(2) චරිත හා සිදුවීම් කිහිපයක් පමණක් තිබීම යි.
(3) සංවාද සහිත කතා පුවතක් ඇතුළත් වීම යි.
(4) අවස්ථාවක් අභිනය මගින් අනුකරණය කිරීම යි.

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක/අනුවර්තක |
|---|---|---|---|
| **A** | ටෙනසී විලියම්ස් | හෙලේ නැඟග ඩොං පුතා | සුගතපාල ද සිල්වා |
| ද පබ්ලික් එනිමි | හෙන්රික් ඉබ්සන් | ජන හතුරා | **B** |
| වෙරි ඕර්චාර්ඩ් | **C** | චෙරිවත්ත | මැන්දිස් රෝහණධීර |
| රූඩන්ස් | ප්ලෝටස් | **D** | බන්ධුල ජයවර්ධන |

**17.** ඉහත වගුවේ **A** කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) කැට් ඔන් ද හොට් ටින් රූෆ් (2) ද ලෝවර් ඩෙප්ත්
(3) අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර් (4) රන් ෆෝ යුවර් වයිෆ්

**18.** ඉහත වගුවේ **B** කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක් ද?
(1) විජිත ගුණරත්න (2) රංජිත් ධර්මකීර්ති
(3) සුනන්ද මහේන්ද්‍ර (4) එදිරිවීර සරච්චන්ද්‍ර

**19.** ඉහත වගුවේ **C** කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචක ගේ නම කුමක් ද?
(1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (2) මැක්සිම් ගෝර්කි (3) ඇන්ටන් චෙකොව් (4) බර්නාඩ් ෂෝ

**20.** ඉහත වගුවේ **D** කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) මකරාක්ෂයා (2) හිරු නැති ලොව (3) වෙස් මුහුණු (4) කඹය

**21.** සාර්ථක ලෙස නාට්‍ය අනුවර්තනය කළ නිර්මාණකරුවන් තිදෙනෙකු ඇතුළත් වරණය තෝරන්න.
(1) ජෙරොම් ද සිල්වා, සුනන්ද මහේන්ද්‍ර, සයිමන් නවගත්තේගම
(2) ආර්.ආර්. සමරකෝන්, රුවන්ති ඩී. චිකේරා, කේ.බී. හේරත්
(3) සුගතපාල ද සිල්වා, ජයලත් මනෝරත්න, ධර්මසිරි බණ්ඩාරනායක
(4) එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණසේන ගලප්පත්ති, හෙන්රි ජයසේන

**22.** ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) නරි බෑණා, බෝඩිංකාරයෝ, මෝදර මෝල, කැළණි පාලම
(2) පබාවතී, කපුවා කපෝති, කුවේණි, මධුර ජවනිකා
(3) මූදු පුත්තු, වහලක් නැති ගෙයක්, බෙරහඬ, මායාදේවී
(4) මහගෙදර, සුදු කරල්, තට්ටු ගෙවල්, හරිම බඩු හයක්

**23.** චරිතාංග අංග රචනය යනු
(1) චරිතයක අභ්‍යන්තර ගතිගුණ හෙළිවන සේ බාහිර පෙනුම වෙනස් කිරීම යි.
(2) චරිතයක වයස, තරාතිරම හා ස්වරූපය ඉස්මතු වන පරිදි බාහිර පෙනුම වෙනස් කිරීම යි.
(3) චරිතයේ යම් පැතිකඩක් හෙළි වන සේ අංග රචනා කිරීම යි.
(4) නළුවා ගේ මනෝභාවයන් හෙළි වන සේ බාහිර පෙනුම වෙනස් කිරීම යි.

**24.** සංගීත අධ්‍යක්ෂවරයා නාට්‍යයකට සංගීතය සැපයිය යුත්තේ
(1) නාට්‍යයේ තේමාව පමණක් ඉස්මතු වන ආකාරයට යි.
(2) නාට්‍ය අධ්‍යක්ෂවරයා ගේ රුචිකත්වය පමණක් සැලකිල්ලට ගනිමින් ය.
(3) නාට්‍යයේ පසුතල දර්ශන මාරු කරන අවස්ථාවල දී පමණකි.
(4) නාට්‍යයේ අර්ථය සහ රසය ජනනය වන පරිදි ය.

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

**25.** කැළණි පාලම නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** සිංහබාහු නාට්‍ය නිර්මාණයට රංගනයෙන් දායක වූයේ
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

**27.** හුණුවටයේ කතාව නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වූයේ
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

**28.** චරිතාංග රංගනයට මෙන් ම හාස්‍ය රංගනයට ප්‍රවීණතාවක් දැක්වූයේ
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

**29.** දික්තල - කාලගෝල නාට්‍යයේ පූර්ණ විරිඳුව ගායනය කරනු ලබන්නේ
(1) ගායක පිරිස විසිනි. (2) බහුබූත කෝලමා විසිනි.
(3) දික්තලා විසිනි. (4) පොතේගුරු විසිනි.

**30.** රංග ක්‍රීඩාවල යෙදීමෙන් ආධුනික නළුවාට
(1) නිර්මාණාත්මක චින්තනය වර්ධනය කරගත හැකි ය.
(2) නර්තන කුශලතා දියුණු කරගත හැකි ය.
(3) සබකෝලය දුරු කරගත හැකි ය.
(4) ගායන හැකියාව වර්ධනය කරගත හැකි ය.

**31.** වස්දොස් එකතු කරගත් මැටි භාජනයක් ගවයකු ගේ හිසෙහි ගසා බිඳීම කැරෙන ශාන්තිකර්මය වන්නේ
(1) ගී මඩුව යි. (2) පූනාමඩුව යි. (3) දෙවොල් මඩුව යි. (4) පහන් මඩුව යි.

**32.** භූමිකාවක් රඟ දක්වන විට නළුවාට උපකාර වන්නේ
(1) පරිකල්පනය හා ශ්වසන අභ්‍යාස ය.
(2) නිර්මාණශීලී චින්තනය හා ශිථිලීකරණ අභ්‍යාස ය.
(3) පරිකල්පනය හා නිර්මාණශීලී චින්තනය ය.
(4) නිර්මාණශීලී චින්තනය හා රංග අභ්‍යාස ය.

**33.** දේශීය නාට්‍ය කලාවට අදාළ ව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බොහෝ චරිතවලට අනන්‍ය වූ ගමන් පද කෝලම්හි දක්නට ඇත.
(2) දියුණු අනුකරණ ලක්ෂණ ඇත්තේ සොකරි ජන නාටකයෙහි පමණ ය.
(3) වඩා ප්‍රාථමික අනුකරණ රූපණ විධි දක්නට ඇත්තේ නාඩගමෙහි ය.
(4) රුක්මණීදේවි රංගනයට පිවිසියේ නූර්ති නාට්‍යවලින් ය.

**34.** නාට්‍ය දර්ශනයක් සම්පූර්ණවීමට තිබිය යුතු ප්‍රධාන අංග තුන ඇතුළත් වරණය කුමක් ද?
(1) පිටපත, නළු-නිළි රංගනය, ප්‍රේක්ෂක පිරිස
(2) පිටපත, අධ්‍යක්ෂ, නළු-නිළි රංගනය
(3) අධ්‍යක්ෂ, නළු-නිළි රංගනය, පසුබිම් සංගීතය
(4) නළු-නිළි රංගනය, රංගාලෝකය, රංගභූමි අලංකරණය

**35.** වී. ක්‍රිස්තියන් පෙරේරා විසින් රචනා කරන ලද නාඩගම් දෙක වන්නේ
(1) මාතලන් සහ සෙනෙගප්පු ය. (2) දිනතර සහ සෙලෙස්තිනා ය.
(3) බ්‍රම්පෝඩි සහ බැලසන්ත ය. (4) ලියනෝරා සහ සුළසෙව් ය.

[පස්වැනි පිටුව බලන්න.

**36.** චාල්ස් ඩයස් විසින් රචනා කර නිෂ්පාදනය කරන ලද නූර්ති දෙක කුමක් ද?
(1) රාමායණය සහ සිරිසඟබෝ
(2) පද්මාවති සහ නාගානන්ද
(3) දස්කොන් සහ දුටුගැමුණු
(4) නල රාජ චරිතය සහ ශ්‍රී වික්‍රම

- පහත දැක්වෙන වෙස් මුහුණු ඇසුරෙන් අංක **37** ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.


**A**


**B**

**37.** මෙහි **A** සහ **B** වෙස් මුහුණු දෙක වන්නේ පිළිවෙළින්,
(1) දේවසන්නිය සහ නොංචි කෝලම යි.
(2) ජස කෝලම සහ වෙඩි සන්නිය යි.
(3) අණබෙර කෝලම සහ ලෙන්චිනා කෝලම යි.
(4) ජල සන්නිය සහ හේවා කෝලම යි.

**38.** නාට්‍ය පෙළ රචනයක සංවාද හඬ නගා කියවීමේ දී නළුවා වඩාත් අවධානයට ගත යුතු කාරණය කුමක් ද?
(1) රචකයා සහ ඔහු ගේ ජීවන දෘෂ්ටිය
(2) කතාවේ පසුබිම සහ රංග ශෛලිය
(3) චරිතවල බාහිර ශාරීරික ලක්ෂණ
(4) චරිතවල හැඟීම් සහ මනෝභාව

**39.** විසිවන සියවසේ 50-60 දශකවල සිංහල නාට්‍ය කලාවේ ප්‍රබෝධයක් ඇති කිරීමට පුරෝගාමී වූ නාට්‍ය අධ්‍යක්ෂකවරයා කවුද?
(1) ජෝන් ද සිල්වා
(2) බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්න
(3) එදිරිවීර සරච්චන්ද්‍ර
(4) ජයලත් මනෝරත්න

**40.** ජැක්සන් ඇන්තනි ගේ කුශලතා වඩාත් ප්‍රකට වූයේ
(1) වේදිකා නාට්‍ය කෘති රචනා කිරීමේ දී ය.
(2) වේදිකා නාට්‍ය අධ්‍යක්ෂණය කිරීමේ දී ය.
(3) කෙටිකතා සහ නවකතා රචනා කිරීමේ දී ය.
(4) චිත්‍රපට සහ ටෙලිනාට්‍ය තිර රචනා ලිවීමේ දී ය.

**

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

50 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

## නාට්‍ය හා රංග කලාව (සිංහල) II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) විකෘති නාට්‍යයේ ප්‍රධාන වශයෙන් කතා කරන්නේ කවුරුන් ගේ ප්‍රශ්න පිළිබඳ ව ද? (ලකුණු 02 යි)

(ii) නාට්‍යයේ සංවාදවල සඳහන් වන ආකාරයට, වැඩිහිටියන් ගේ ප්‍රාර්ථනා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(iii) විකෘති නාට්‍යයේ ප්‍රධාන කතා නායිකාව කවුද? (ලකුණු 02 යි)

(iv) ඉහත (iii) හි සඳහන් කතා නායිකාව ගේ මානසික වෙනසට බලපෑ හේතුව කුමක් ද? (ලකුණු 02 යි)

(v) කතා නායිකාව සමග 'විහාගේ විහාගේ .........' යන ගීතය ගායනා කරන වෙනත් පාත්‍රයන් **දෙදෙනකු ගේ** නම් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(vi) නාට්‍යය අවසානයේ යොවුන් පිරිස විසින් ගුරුන් සහ දෙගුරුන් ගෙන් අපේක්ෂා කරන ලෝකය කුමක් ද? (ලකුණු 02 යි)

**2.** (i) 'රූපණය' යනු කුමක් දැ යි හඳුන්වන්න. (ලකුණු 02 යි)

(ii) රූපණ ශිල්පියකු විසින් ප්‍රගුණ කළ යුතු කුශලතා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) වේදිකාව මත රඟපෑමේ දී නළු-නිළියන් විසින් අවධානයට ගත යුතු කරුණු මොනවා දැ යි පෙන්වාදෙන්න. (ලකුණු 06 යි)

**3.** (i) 'නාට්‍ය' යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) නාට්‍ය කලාවට සුවිශේෂ වූ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) තේමාව, නාට්‍යයේ ශෛලිය, චරිත හා සිදුවීම්, ගැටුම් අවස්ථා, ආනුෂංගික අංග යනාදිය කෙරෙහි අවධානය යොමු කරමින් ඔබ නැරඹූ නාට්‍ය නිර්මාණයක් පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) දේශීය ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කළ එක් ශාන්තිකර්මයක අඩංගු නාට්‍යමය පෙළපාළි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (ii) හි සඳහන් කළ එක් නාට්‍යමය පෙළපාලියක ඇතුළත් වන නාට්‍යමය ලක්ෂණ මොනවා දැ යි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) නාඩගම් රඟ දැක්වූ කරළියක රූප සටහනක් ඇඳ, එහි කොටස් හඳුන්වාදෙන්න. (ලකුණු 02 යි)

(ii) පැරණි නාඩගම් ප්‍රචලිතව පැවති ප්‍රදේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) නාඩගම් සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ මොනවා දැ යි විමර්ශනය කරන්න. (ලකුණු 06 යි)

[ හත්වැනි පිටුව බලන්න.

6. (i) පරාක්‍රම නිරිඇල්ල විසින් අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) 'ජන කරළිය' යනු කුමක් දැ යි හඳුන්වා දී ඊට ආවේණික වූ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට පරාක්‍රම නිරිඇල්ල ගෙන් සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන ලෙස් නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

කොළඹ පැවැත්වෙන නාට්‍ය උළෙලක වේදිකාගත වන ළමා නාට්‍යයක් නැරඹීමට 11 ශ්‍රේණියේ සිසුන් රැගෙන යන බව ගුරුතුමා පන්තියේ දී දැනුම් දෙයි. සුනිල් ගෙදර පැමිණ අම්මාට පවසන්නේ නාට්‍ය නැරඹීමට යන එක් ළමයකු ගෙන් රු. 2000ක් එකතු කරන බව යි. මෙය අසා තාත්තා කෝපයට පත් වෙයි. රැකියාවක් කරන සුනිල් ගේ ලොකු අයියාට අම්මා කියාසිටින්නේ නාට්‍ය බැලීමට කෙසේ හෝ මල්ලීට මුදල් සොයා දිය යුතු බව යි.

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 50 - නාට්‍ය හා රංග කලාව

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතු ව ඇත.

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 50 - නාට්‍ය හා රංග කලාව

**ලකුණු බෙදීයාම**

**I පත්‍රය**

**ලකුණු 1 X 40 = 40 කි.**

**II පත්‍රය**

II පත්‍රය ප්‍රශ්න 07 කි. 01 වන ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. ඉතිරි ප්‍රශ්න 06 යෙන් 04 ක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.

01 ප්‍රශ්නයට ලකුණු 12 කි.

* තෝරාගන්නා ඉතිරි ප්‍රශ්න 04 කට ලකුණු 12 X 04 = 48 කි.

02 ප්‍රශ්නයට ලකුණු 12 කි.
03 ප්‍රශ්නයට ලකුණු 12 කි.
04 ප්‍රශ්නයට ලකුණු 12 කි.
05 ප්‍රශ්නයට ලකුණු 12 කි.
06 ප්‍රශ්නයට ලකුණු 12 කි.
07 ප්‍රශ්නයට ලකුණු 12 කි.

} ඕනෑ ම ප්‍රශ්න 04 ට ලකුණු 48 කි.

| | |
|---|---|
| I පත්‍රයට ලකුණු | 40 |
| II පත්‍රයට ලකුණු | 60 |
| **මුළු ලකුණු** | **100** |

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................ √ △ $\frac{3}{5}$

(03) එකතුව ➡ □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.
II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.
III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.
IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.
V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.
**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපාහරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැ යි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළ දී ගණනය කරනු නො ලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙන ම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 50 - නාට්‍ය හා රංග කලාව

## I පත්‍රය - අභිමතාර්ථ

නිපුණතාපාදක විෂය මාලාව අනුව සියලු ම නිපුණතා ආවරණය වන සේ ප්‍රශ්න අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සකසා ඇත. එය පහත සඳහන් පරිදි වේ.

- ප්‍රශ්න අංක 01 සිට 04 දක්වා ප්‍රශ්න සිවුවන හා පස්වන නිපුණතා ආවරණය වන පරිදි සකසා ඇත.
- ප්‍රශ්න අංක 05 සිට 16 දක්වා ප්‍රශ්න පළමුවන, දෙවන, තෙවන හා සිවුවන නිපුණතා ආවරණය වන පරිදි ද,
- ප්‍රශ්න අංක 17 සිට 24 දක්වා ප්‍රශ්න දෙවන හා තෙවන නිපුණතා ආවරණය වන පරිදි ද,
- ප්‍රශ්න අංක 25 සිට 30 දක්වා ප්‍රශ්න සිවුවන නිපුණතාව යටතේ ද,
- ප්‍රශ්න අංක 31 - පළමුවන නිපුණතාව යටතේ ද,
- ප්‍රශ්න අංක 32 - 40 දක්වා ප්‍රශ්න පළමුවන තෙවන සිවුවන හා පස්වන නිපුණතා යටතේ ද සකස් කර ඇත.

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

- ප්‍රශ්න සංඛ්‍යාව 40 කි.
- එක් එක් ප්‍රශ්නයේ ඇති (1),(2),(3),(4) වරණ 4 අතුරින් නිවැරදි හෝ වඩාත් උචිත හෝ පිළිතුරේ අංකයට සැසඳෙන කවය (x) සලකුණු කර ඇත්නම් 01 ලකුණක් දෙන්න.
- එක් වරණයකට 01 බැගින් ප්‍රශ්න 40ට ලැබෙන මුළු ලකුණු සංඛ්‍යාව
  (01 x 40) = **40** කි.

## II පත්‍රය - අභිමතාර්ථ

- ❖ ප්‍රශ්න අංක 01 අදාළ නිර්දිෂ්ට නාට්‍ය පෙළ ඇසුරෙන් සකස් කර ඇත. එය කොටස් හයකින් සමන්විත වේ. දැනුම, ආකල්ප සහ කුශලතා මැනෙන පරිදි කෙටි පිළිතුරු සැපයිය යුතු ආකාරයට මෙම අනුකොටස් සකස් කර ඇත.
- ❖ තුන්වන හා හතරවන නිපුණතාව ආවරණය වන පරිදි 02 ප්‍රශ්නය සකස් කර ඇත.
- ❖ සිව්වන නිපුණතාව ආවරණය වන පරිදි 03 ප්‍රශ්නය සකස් කර ඇත.
- ❖ ප්‍රශ්න අංක 04 සහ 05 ප්‍රශ්න සඳහා දෙවන තෙවන හා පස්වන නිපුණතා ආවරණය වන පරිදි සකස් කර ඇත.
- ❖ ප්‍රශ්න අංක 06 සිවුවන නිපුණතාව ආවරණය වන පරිදි සකස්කර ඇත.
- ❖ ප්‍රශ්න අංක 07 තෙවන නිපුණතාව ආවරණය වන පරිදි සකස් කර ඇත. ශිෂ්‍යයා ගේ පරිකල්පනය හා නිර්මාණශීලි රචනා හැකියාව මෙමගින් අපේක්ෂා කෙරේ.
- ❖ එක් ප්‍රශ්නයට ලකුණු 12 බැගින් ප්‍රශ්න 05කට හිමි ලකුණු 12 x 5 = 60

## II පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

ප්‍රශ්න 07 කින් යුක්ත ය. එයින් පළමු වැනි ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර අනෙක් ප්‍රශ්න 06 න් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

- ❖ පළමුවැනි ප්‍රශ්නය කොටස් 06 කින් යුක්ත ය. සෑම කොටසකට ම ලකුණු 02 බැගිනි.
- ❖ දෙවන ප්‍රශ්නයේ සිට හය වන ප්‍රශ්නය දක්වා (I),(II),(III) වශයෙන් කොටස් 03 කින් යුක්ත ය.
- ❖ දෙවන ප්‍රශ්නයේ සවැනි ප්‍රශ්නය දක්වා එක් එක් කොටසට හිමි ලකුණු සංඛ්‍යාව පිළිවෙලින් 02, 04, 06 වශයෙනි. ප්‍රශ්නයකට හිමි සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 12 කි.
- ❖ ප්‍රශ්නයකට එක් එක් කොටස සඳහා වෙන් කොට ඇති ලකුණු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන අපේක්ෂකයා සපයා ඇති පිළිතුරට අනුව ලකුණු සංඛ්‍යාව තීරණය කළ යුතු ය.
- ❖ සම්පූර්ණ ලකුණු පිරිනැමීම සඳහා පිළිතුරට අපේක්ෂිත කරුණු සියල්ල ම ඇතුළත් විය යුතු ය.
- ❖ පිළිතුරු සංඛ්‍යාව 05කට වැඩියෙන් ලියා ඇති කල්හි අමතර පිළිතුරුවලින් ලකුණු අඩුවෙන් ලබා ඇති පිළිතුරු ඉවත් කිරීම සුදුසු ය.
- ❖ හත්වන ප්‍රශ්නය ඇගයීමට ලක් කිරීමේ දී කොටස් තුනකට අදාළ ව ලකුණු කිරීම කළ යුතු ය. එක් එක් කොටස සඳහා ලකුණු 04 බැගිනි. ප්‍රශ්නයට හිමි සම්පූර්ණ ලකුණු සංඛ්‍යාව 12 කි.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ඇසුවන් නිවැරදි තම හිමියන්නේ
සිටිමින් පත්තිනි බල පාමින්නේ
ඉතිකින් නැත අප වරද බොලන්නේ
යමු දැන් පඬි පුරයට අපි දෙන්නේ

B අණබෙර කාරයෙක් - සමග එන හේවායෙක්
සුදු සෙබළ දෙදෙනෙක් සමග ලන්දේසි යුවලක්

C දන්න වං හුං අප කන්න සාමි රාජ ධූරයේ
රාජ ධූර රාජ ධූර රාජ ධූරයේ
රකි බුද්ධ ධර්ම සීල පූර්වේ රජුන් ලෙසේ
අධර්මිෂ්ඨ නීච ක්‍රියා යයි මැකී ළයේ

D ඈත කඳුකර හිමව් අරණේ – සීත චන්දන ළපලු සෙවනේ
සුළං රැල්ලේ පාව එන්නේ – ඔහුගේ නාමය වේ

E රුවිනා පුත් සඳසෙ බබළනා – සිරියා කොමළියෙ
රැගෙනා දැන් බලනු මෙහසුනා
ගම්බීර මගෙ පිය නරවර – ගෙන් මෙහසුන ලැබුණි මෙමට
පෙම්බරයෙනි මෙනුවර හැර – යන්නට සිදු විය පියපුර

**1.** කෝලම් ජන නාටකය හා සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**2.** නූර්ති නාට්‍යයක් හා සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

**3.** මද්දලය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරමින් ගායනා කරන ලද්දේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**4.** මහගමසේකර විසින් රචනා කරන ලද්දේ
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**5.** ප්‍රාසංගික කලා පමණක් අඩංගු වරණය තෝරන්න.
(1) ගුවන්විදුලි නාට්‍ය, චිත්‍රපට, වේදිකා නාට්‍ය, බැලේ
(2) ගීත නාට්‍ය, ඔපෙරා, බැලේ, නර්තනය
(3) අභිරූපණ රංග, ගායනය, ටෙලි නාට්‍ය, වේදිකා නාට්‍ය
(4) ඔපෙරා, මුද්‍රා නාට්‍ය, චිත්‍ර, වාදනය

**6.** නෘත්‍ය යනුවෙන් අදහස් කරන්නේ
(1) කිසියම් අර්ථයක් හෝ භාවයක් නිරූපණය කරන නර්තනයකි.
(2) අංග වික්ෂේප භාවිත කර රිද්මයානුකූල ව හා ශෝභමාන ව සිදුකරන නැටුමකි.
(3) අර්ථ විරහිත ව සිදු කරනු ලබන නර්තනයකි.
(4) සතර අභිනය භාවිත කර සිදු කරනු ලබන රඟුමකි.

**7.** නාට්‍යශාස්ත්‍ර ග්‍රන්ථයේ කර්තෘත්වය හිමි වන්නේ කාට ද?
(1) භරතමුනි (2) අභිනවගුප්ත (3) නන්දිකේශ්වර (4) ධනංජය

**8.** අඳුරු වේදිකාවේ එක් චරිතයක් කෙරෙහි පමණක් ප්‍රේක්ෂකයා ගේ අවධානය යොමු කරවීම පිණිස යොදාගනු ලබන ආලෝක පහන කුමක් ද?
(1) ධාරාලෝක පහන (2) යොමු පහන
(3) හැලජන් පහන (4) අල්ට්‍රා වයලට් පහන

**9.** පින්තූර රාමු වේදිකාව මනඃකල්පිත ලෙස කොටස් නවයකට බෙදීම වඩාත් ප්‍රයෝජනවත් වන්නේ
(1) පසුතල නිර්මාණ ශිල්පීන්ට, අධ්‍යක්ෂවරයාට සහ ප්‍රේක්ෂකයාට ය.
(2) නිෂ්පාදකවරයාට, රංගන ශිල්පීන්ට සහ ප්‍රේක්ෂකයාට ය.
(3) නාට්‍ය රචකයාට, ආනුෂංගික ශිල්පීන්ට සහ රංගන ශිල්පීන්ට ය.
(4) රංගන ශිල්පීන්ට, අධ්‍යක්ෂවරයාට සහ රංගාලෝක ශිල්පීන්ට ය.

**10.** රූපණ ශිල්පියකු පෙර පුහුණුවීම්වල දී බිම වැතිරී දෑස් පියා සංගීත ඛණ්ඩයකට සවන් දෙමින් මානසික සැහැල්ලුව ලබා ගැනීම
(1) පරිකල්පන අභ්‍යාසයකි. (2) ශ්වසන අභ්‍යාසයකි.
(3) ශිථිලකරණ අභ්‍යාසයකි. (4) සංවේදන අභ්‍යාසයකි.

**11.** නවක රූපණ ශිල්පියකුට කටහඬ පුහුණු අභ්‍යාස සඳහා වඩාත් සුදුසු ග්‍රන්ථ ත්‍රිත්වය වන්නේ
(1) වදන්කවි පොත, සුභාෂිතය සහ නම්පොත ය.
(2) පිරුවානා පොත, බුද්ධ ගජ්ජය සහ සකස්කඩ ය.
(3) සකස්කඩ, බුද්ධ ගජ්ජය සහ නම්පොත ය.
(4) ජාතක පොත, භගවත් ගීතාව සහ බුද්ධ ගජ්ජය ය.

**12.** නාට්‍යයක ඒකාකාරී ගලායාම වෙනස් කර ප්‍රබල අරුතක් සහිත දෘශ්‍ය රූපයක් මැවීමට උපකාරී වන්නේ
(1) අංග රචනය යි. (2) රංග රචනය යි.
(3) නාට්‍ය සංගීතය යි. (4) රංගාලෝකය යි.

**13.** නර්තනානුකූල රංග වින්‍යාසයක් යොදාගත් අවස්ථාවකට නිදසුනක් වන්නේ
(1) හුණුවටයේ කතාව නාට්‍යයේ ග්රූෂා වැල්පාලමේ යන ආකාරය ය.
(2) මනමේ නාට්‍යයේ මනමේ කුමරු හා වැදි රජු අතර සටන ය.
(3) කුවේණි නාට්‍යයේ ජීවහත්ථ හා දිසාලා සමග දඩයක්කරු හමු වන මොහොත ය.
(4) කදා වළලු නාට්‍යයේ කච්ඡපුට වෙළෙන්දා ගෙන් වළලු මිල දී ගැනීම ය.

**14.** රංගභූමි අලංකරණය යන්න නිවැරදි ව දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.
(1) දර්ශනයට උචිත වන පරිදි වේදිකාව සකස් කිරීම
(2) තිර රෙදි පමණක් යොදා වේදිකාව සකස් කිරීම
(3) දෙබස්වලින් මවන පරිසරයට අනුව වේදිකාව සැකසීම
(4) වේදිකාව විචිත්‍ර වර්ණවලින් සැරසීම

**15.** කරදිය මුද්‍රා නාට්‍යයට සංගීතය සැපයූ සංගීතඥයා කවුද?
(1) ඩබ්ලිව්. ඩී. අමරදේව (2) ප්‍රේමසිරි කේමදාස
(3) සෝමදාස ඇල්විටිගල (4) ඩබ්ලිව්. බී. මකුලොලුව

**16.** නාට්‍යයක්, කතාන්දරයකින් වෙනස් වන එක් ලක්ෂණයක් වන්නේ
(1) සිද්ධි මාලාවක් අනුපිළිවෙළින් රචනා කිරීම යි.
(2) චරිත හා සිදුවීම් කිහිපයක් පමණක් තිබීම යි.
(3) සංවාද සහිත කතා පුවතක් ඇතුළත් වීම යි.
(4) අවස්ථාවක් අභිනය මගින් අනුකරණය කිරීම යි.

● පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක/අනුවර්තක |
|---|---|---|---|
| **A** | ටෙනසී විලියම්ස් | හෙලේ නැග්ග ඩෝං පුතා | සුගතපාල ද සිල්වා |
| ද පබ්ලික් එනිමි | හෙන්රික් ඉබ්සන් | ජන හතුරා | **B** |
| වෙරි ඕර්වාර්ඩ් | **C** | වෙරිවත්ත | මැන්දිස් රෝහණධීර |
| රුඩන්ස් | ප්ලෝටස් | **D** | බන්ධුල ජයවර්ධන |

**17.** ඉහත වගුවේ **A** කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) කැට් ඔන් ද හොට් ටින් රූෆ් (2) ද ලෝවර් ඩෙප්ත්
(3) අ ස්ට්‍රීට් කාර් නේම්ඩ් ඩිසයර් (4) රන් ෆෝ යුවර් වයිෆ්

**18.** ඉහත වගුවේ **B** කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක් ද?
(1) විජිත ගුණරත්න (2) රංජිත් ධර්මකීර්ති
(3) සුනන්ද මහේන්ද්‍ර (4) එදිරිවීර සරච්චන්ද්‍ර

**19.** ඉහත වගුවේ **C** කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචක ගේ නම කුමක් ද?
(1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (2) මැක්සිම් ගෝර්කි (3) ඇන්ටන් චෙකොව් (4) බර්නාඩ් ෂෝ

**20.** ඉහත වගුවේ **D** කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) මකරාක්ෂයා (2) හිරු නැති ලොව (3) වෙස් මුහුණු (4) කඹය

**21.** සාර්ථක ලෙස නාට්‍ය අනුවර්තනය කළ නිර්මාණකරුවන් තිදෙනෙකු ඇතුළත් වරණය තෝරන්න.
(1) ජෙරොම් ද සිල්වා, සුනන්ද මහේන්ද්‍ර, සයිමන් නවගත්තේගම
(2) ආර්.ආර්. සමරකෝන්, රුවන්ති ඩී. චිකේරා, කේ.බී. හේරත්
(3) සුගතපාල ද සිල්වා, ජයලත් මනෝරත්න, ධර්මසිරි බණ්ඩාරනායක
(4) එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණසේන ගලප්පත්ති, හෙන්රි ජයසේන

**22.** ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) නරි බෑණා, බෝඩිංකාරයෝ, මෝදර මෝල, කැළණි පාලම
(2) පබාවතී, කපුවා කපෝති, කුවේණි, මධුර ජවනිකා
(3) මූදු පුත්තු, වහලක් නැති ගෙයක්, බෙරහඬ, මායාදේවී
(4) මහගෙදර, සුදු කරල්, තට්ටු ගෙවල්, හරිම බඩු හයක්

**23.** චරිතාංග අංග රචනය යනු
(1) චරිතයක අභ්‍යන්තර ගතිගුණ හෙළිවන සේ බාහිර පෙනුම වෙනස් කිරීම යි.
(2) චරිතයක වයස, තරාතිරම හා ස්වරූපය ඉස්මතු වන පරිදි බාහිර පෙනුම වෙනස් කිරීම යි.
(3) චරිතයේ යම් පැතිකඩක් හෙළි වන සේ අංග රචනා කිරීම යි.
(4) නළුවා ගේ මනෝභාවයන් හෙළි වන සේ බාහිර පෙනුම වෙනස් කිරීම යි.

**24.** සංගීත අධ්‍යක්ෂවරයා නාට්‍යයකට සංගීතය සැපයිය යුත්තේ
(1) නාට්‍යයේ තේමාව පමණක් ඉස්මතු වන ආකාරයට යි.
(2) නාට්‍ය අධ්‍යක්ෂවරයා ගේ රුචිකත්වය පමණක් සැලකිල්ලට ගනිමින් ය.
(3) නාට්‍යයේ පසුතල දර්ශන මාරු කරන අවස්ථාවල දී පමණකි.
(4) නාට්‍යයේ අර්ථය සහ රසය ජනනය වන පරිදි ය.

[ඉතිරිවැනි පිටුව බලන්න]

● පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

**25.** කැළණි පාලම නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** සිංහබාහු නාට්‍ය නිර්මාණයට රංගනයෙන් දායක වූයේ
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

**27.** හුණුවටයේ කතාව නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වූයේ
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

**28.** චරිතාංග රංගනයට මෙන් ම හාස්‍ය රංගනයට ප්‍රවීණතාවක් දැක්වූයේ
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

**29.** දික්තල - කාලගෝල නාට්‍යයේ පූර්ණ විරිඳුව ගායනය කරනු ලබන්නේ
(1) ගායක පිරිස විසිනි. (2) බහුබූත කෝලමා විසිනි.
(3) දික්තලා විසිනි. (4) පොතේගුරු විසිනි.

**30.** රංග ක්‍රීඩාවල යෙදීමෙන් ආධුනික නළුවාට
(1) නිර්මාණාත්මක චින්තනය වර්ධනය කරගත හැකි ය.
(2) නර්තන කුශලතා දියුණු කරගත හැකි ය.
(3) සබකෝලය දුරු කරගත හැකි ය.
(4) ගායන හැකියාව වර්ධනය කරගත හැකි ය.

**31.** වස්දොස් එකතු කරගත් මැටි භාජනයක් ගවයකු ගේ හිසෙහි ගසා බිඳීම කැරෙන ශාන්තිකර්මය වන්නේ
(1) ගී මඩුව යි. (2) පූනාමඩුව යි. (3) දෙවොල් මඩුව යි. (4) පහන් මඩුව යි.

**32.** භූමිකාවක් රඟ දක්වන විට නළුවාට උපකාර වන්නේ
(1) පරිකල්පනය හා ශ්වසන අභ්‍යාස ය.
(2) නිර්මාණශීලී චින්තනය හා ශිථිලීකරණ අභ්‍යාස ය.
(3) පරිකල්පනය හා නිර්මාණශීලී චින්තනය ය.
(4) නිර්මාණශීලී චින්තනය හා රංග අභ්‍යාස ය.


**33.** දේශීය නාට්‍ය කලාවට අදාළ ව වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) බොහෝ චරිතවලට අනන්‍ය වූ ගමන් පද කෝලම්හි දක්නට ඇත.
(2) දියුණු අනුකරණ ලක්ෂණ ඇත්තේ සොකරි ජන නාටකයෙහි පමණ ය.
(3) වඩා ප්‍රාථමික අනුකරණ රූපණ විධි දක්නට ඇත්තේ නාඩගමෙහි ය.
(4) රුක්මණීදේවි රංගනයට පිවිසියේ නූර්ති නාට්‍යවලින් ය.


**34.** නාට්‍ය දර්ශනයක් සම්පූර්ණවීමට තිබිය යුතු ප්‍රධාන අංග තුන ඇතුළත් වරණය කුමක් ද?
(1) පිටපත, නළු-නිළි රංගනය, ප්‍රේක්ෂක පිරිස
(2) පිටපත, අධ්‍යක්ෂ, නළු-නිළි රංගනය
(3) අධ්‍යක්ෂ, නළු-නිළි රංගනය, පසුබිම් සංගීතය
(4) නළු-නිළි රංගනය, රංගාලෝකය, රංගභූමි අලංකරණය

**35.** වී. ක්‍රිස්තියන් පෙරේරා විසින් රචනා කරන ලද නාඩගම් දෙක වන්නේ
(1) මාතලන් සහ සෙනෙගප්පු ය. (2) දිනතර සහ සෙලෙස්තිනා ය.
(3) බ්‍රම්පෝඩි සහ බැලසන්ත ය. (4) ලියනෝරා සහ සුසෙව් ය.

**36.** චාල්ස් ඩයස් විසින් රචනා කර නිෂ්පාදනය කරන ලද නූර්ති දෙක කුමක් ද?
(1) රාමායණය සහ සිරිසඟබෝ
(2) පද්මාවතී සහ නාගානන්ද
(3) දස්කොන් සහ දුටුගැමුණු
(4) නල රාජ චරිතය සහ ශ්‍රී වික්‍රම

- පහත දැක්වෙන වෙස් මුහුණු ඇසුරෙන් අංක **37** ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.


**A**


**B**

**37.** මෙහි **A** සහ **B** වෙස් මුහුණු දෙක වන්නේ පිළිවෙළින්,
(1) දේවසන්නිය සහ නොංචි කෝලම යි.
(2) ජස කෝලම් සහ වෙඩි සන්නිය යි.
(3) අණබෙර කෝලම සහ ලෙන්චිනා කෝලම යි.
(4) ජල සන්නිය සහ හේවා කෝලම යි.

**38.** නාට්‍ය පෙළ රචනයක සංවාද හඬ නගා කියවීමේ දී නළුවා වඩාත් අවධානයට ගත යුතු කාරණය කුමක් ද?
(1) රචකයා සහ ඔහු ගේ ජීවන දෘෂ්ටිය
(2) කතාවේ පසුබිම සහ රංග ශෛලිය
(3) චරිතවල බාහිර ශාරීරික ලක්ෂණ
(4) චරිතවල හැඟීම් සහ මනෝභාව

**39.** විසිවන සියවසේ 50-60 දශකවල සිංහල නාට්‍ය කලාවේ ප්‍රබෝධයක් ඇති කිරීමට පුරෝගාමී වූ නාට්‍ය අධ්‍යක්ෂකවරයා කවුද?
(1) ජෝන් ද සිල්වා
(2) බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්න
(3) එදිරිවීර සරච්චන්ද්‍ර
(4) ජයලත් මනෝරත්න

**40.** ජැක්සන් ඇන්තනි ගේ කුශලතා වඩාත් ප්‍රකට වූයේ
(1) වේදිකා නාට්‍ය කෘති රචනා කිරීමේ දී ය.
(2) වේදිකා නාට්‍ය අධ්‍යක්ෂණය කිරීමේ දී ය.
(3) කෙටිකතා සහ නවකතා රචනා කිරීමේ දී ය.
(4) චිත්‍රපට සහ ටෙලිනාට්‍ය තිර රචනා ලිවීමේ දී ය.

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2023 (2024)

විෂය අංකය / பாட இலக்கம்: **50**

විෂයය / பாடம்: **නාට්‍ය හා රංග කලාව**

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 4 | 31. | 2 |
| 02. | 3 | 12. | 2 | 22. | 1 | 32. | 3 |
| 03. | 4 | 13. | 2 | 23. | 2 | 33. | 1 |
| 04. | 3 | 14. | 1 | 24. | 4 | 34. | 1 |
| 05. | 2 | 15. | 1 | 25. | 2 | 35. | 3 |
| 06. | 1 | 16. | 4 | 26. | 3 | 36. | 2 |
| 07. | 1 | 17. | 1 | 27. | 4 | 37. | 3 |
| 08. | 2 | 18. | 3 | 28. | 1 | 38. | 4 |
| 09. | 4 | 19. | 3 | 29. | 4 | 39. | 3 |
| 10. | 3 | 20. | 4 | 30. | 3 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40

## නාට්‍ය හා රංග කලාව (සිංහල) - II පත්‍රය

1. විකෘති නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) විකෘති නාට්‍යයේ ප්‍රධාන වශයෙන් කතා කරන්නේ කවුරුන් ගේ ප්‍රශ්න පිළිබඳ ව ද? (ලකුණු 02 යි)
   (ii) නාට්‍යයේ සංවාදවල සඳහන් වන ආකාරයට, වැඩිහිටියන් ගේ ප්‍රාර්ථනා **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 02 යි)
   (iii) විකෘති නාට්‍යයේ ප්‍රධාන කතා නායිකාව කවුද? (ලකුණු 02 යි)
   (iv) ඉහත (iii) හි සඳහන් කතා නායිකාව ගේ මානසික වෙනසට බලපෑ හේතුව කුමක් ද? (ලකුණු 02 යි)
   (v) කතා නායිකාව සමග 'විභාගේ විභාගේ .......' යන ගීතය ගායනා කරන වෙනත් පාත්‍රයන් **දෙදෙනකු** ගේ නම් සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (vi) නාට්‍යය අවසානයේ යොවුන් පිරිස විසින් ගුරුන් සහ දෙගුරුන් ගෙන් අපේක්ෂා කරන ලෝකය කුමක් ද? (ලකුණු 02 යි)

i. යොවුන් පරපුරේ ප්‍රශ්න පිළිබඳ ව (ලකුණු 02 යි)

ii.
- තම දරුවන් උසස් යැ යි සම්මත රැකියාවකට යැවීම
- දරුවන් උසස් අධ්‍යාපනට කරවීම යොමු කරවීම
- ඉහළට ඉගෙනගැනීම
- විභාග ඉහළින් සමත් කරවීම
- දරුවන්ට දුක් කරදරවලින් තොර සැප සම්පත් පිරි ජීවිතයක් උරුම කර දීම
- දරුවන්ට හොඳ විවාහ ජීවිතයක් ලබාදීම

(මෙවැනි කරුණු 02 ක් ලියා ඇත්නම් ලකුණු 02 යි)

iii ප්‍රියංගනී (ලකුණු 02 යි)

iv
- ප්‍රියංගනී කැමති විෂයන් වෙනුවට අකමැති විෂයන් ඉගෙනගැනීමට බලෙන් යොමු කරවීම
- තරඟකාරී අධ්‍යාපනය
- වෛද්‍යවරියක් වීමට අධික ලෙස ඉගැනීමේ කටයුතුවල යෙදී මානසික පීඩාවට පත්වීම
- ප්‍රියංගනීට කැමති විනෝදාංශවල යෙදීමට ඉඩකඩ නොලැබීම.

(මේ හා සමාන එක කරුණක් ලියා ඇත්නම් ලකුණු 02 යි)

v.
- චන්න • සම්පත් • රංජිත්
- මිතුරියා1 • මිතුරිය 2

(නම් දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු 02 යි)

vi.
- කෑමට-බීමට, ඇඳුමට-පැළඳුමට, ගෙයට-දොරට, යාන-වාහන තරගයක් නැති ලෝකයක්
- සමානාත්මතාව සහිත ලෝකයක්
- සහජ දස්කම් අනුව, රුචිය අරුචිය, අනුව වැඩ පුහුණුවන්නට-නිපැයුමෙහි යෙදෙන්නට සහන ගෙනදෙන ලොවක්

(මෙම එක් කරුණක් ලියා ඇත්නම් ලකුණු 02 යි)

| | |
|---|---|
| **2.** (i) 'රූපණය' යනු කුමක් දැ යි හඳුන්වන්න. | (ලකුණු 02 යි) |
| (ii) රූපණ ශිල්පියකු විසින් ප්‍රගුණ කළ යුතු කුශලතා **හතරක්** සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) වේදිකාව මත රඟපෑමේ දී නළු-නිළියන් විසින් අවධානයට ගත යුතු කරුණු මොනවා දැ යි පෙන්වාදෙන්න. | (ලකුණු 06 යි) |

i. රූපණය යනු කුමක් දැ යි පැහැදිලි කෙරෙන නිර්වචන කීපයක් මෙසේ ය.

- කිසියම් චරිතයකට ආරෝපණය වී යම්කිසි කාලසීමාවක් එම චරිතය තුළ ජීවත් වීම රූපණය යි .
- දෛනික ජීවිතයේ දී මිනිසුන් අවිඥානිකව කරන කියන දේ වේදිකාව මත දී සවිඥානිකව සිදුකර පෙන්වීම.
- කිසියම් පුද්ගලයකු නළුවකු ලෙසට ප්‍රේක්ෂකයන් තුළ කිසියම් බලපෑමක් ඇති කිරීම සඳහා සවිඥානික උත්සාහයක යෙදීම.
- රඟපාන චරිතය හා අවස්ථාව නිර්මාණයට ගැළපෙන අයුරින් සත්‍ය හා විශ්වසනීයත්වය පිළිබඳ මායාවක් ඇති කෙරෙන සේ ඉදිරිපත් කිරීම.
- චරිත නිරූපණයේ දී නළුවා තමාට ආවේණික චරිත ලක්ෂණ යටපත් කොට වෙනත් කෙනෙකු ගේ චරිත ලක්ෂණ ආරෝපණය කරගෙන එම ආරෝපණය සත්‍යයක් ලෙස ප්‍රේක්ෂකයාට පෙනෙන්නට සැලැස්වීම.

(ඉහත දැක්වෙන නිර්වචනයක් හෝ ඊට සමාන අදහසක් ලියා ඇත්නම් ලකුණු 02 යි.)

ii. රූපණ ශිල්පියකු විසින් ප්‍රගුණ කළ යුතු කුශලතා

- අනුකරණ හැකියාව
- නර්තන හැකියාව
- ගායන හැකියාව
- පරිකල්පන ශක්තිය
- පැහැදිලි කටහඬ හා ශබ්ද උච්චාරණය
- ශාරීරික නම්‍යශීලී බව
- ස්මරණ ශක්තිය
- කායික මානසික සංවේදී බව
- අභිරූපණ හැකියාව

(මෙවැනි කරුණු හතරක් සඳහා ලකුණු 04 යි)

iii. වේදිකාව මත රඟපෑමේ දී නළු නිළියන් විසින් අවධානයට ගත යුතු කරුණු

- නාට්‍ය පිටපත පිළිබඳ මනා අවබෝධයෙන් රංගණයේ නිරත වීම.
- සංවාද මැනවින් ධාරණය හා නිවැරදි උච්චාරණය.
- පුහුණුවීමේ දී අධ්‍යක්ෂවරයා ලබා දුන් උපදෙස් හා රංග විධාන පිළිපැදීම.
- නාට්‍ය ශෛලියට හා රූපණ ශෛලියට අනුව රංගනය ඉදිරිපත් කිරීම.
- තමා රඟපාන චරිතයට ගැළපෙන පරිදි ආංගික හා සාත්ත්වික අභිනය පෑම.
- සෙසු නළු -නිළියන් වේදිකාව මත ස්ථානගත වී ඇති ආකාරය සැලකිල්ලට ගෙන රඟපෑම.
- ආනුෂාංගික අංග පිළිබඳ ව මනා අවබෝධයෙන් යුතු ව රූපණයේ නිරත වීම.
- වේදිකා අවකාශය හා වේදිකා භූගෝලය පිළිබඳ ව අවබෝධයෙන් යුතුව රංගණයේ නිතර වීම.
- නාට්‍යෝපකරණ නිවැරදි ලෙස පරිහරණය කිරීමට වගබලාගැනීම.
- රංගාලෝකය ගැන සැලකිලිමත් වීම.

(මෙවැනි කරුණු තුනක් සඳහන් කර ඇත්නම් ලකුණු 06 යි)

3. (i) 'නාට්‍ය' යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)
(ii) නාට්‍ය කලාවට සුවිශේෂ වූ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) තේමාව, නාට්‍යයේ ශෛලිය, චරිත හා සිදුවීම්, ගැටුම් අවස්ථා, ආනුෂංගික අංග යනාදිය කෙරෙහි අවධානය යොමු කරමින් ඔබ නැරඹූ නාට්‍ය නිර්මාණයක් පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 06 යි)

i.
- "නාට්‍ය යනු ක්‍රියා අනුකරණය කිරීම යි." - ඇරිස්ටෝටල්
- "නාට්‍ය යනු ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීම යි." - භරතමුනි
- "නාට්‍ය යනු අවස්ථාවක් අනුකරණය කිරීම යි.' - ධනංජය
- "නාට්‍ය යනු ලෝකයේ සුඛදු:ඛස්වභාවයෙන් යුක්ත වූ යම් පැවැත්මක් ඇත් ද එය ආංගිකාදි අභිනයෙන් ප්‍රකාශ කිරීම යි." - භරතමුනි
- "නාට්‍ය යනු නළු/නිළියන් ගේ මාර්ගයෙන් වේදිකාවක් මත ප්‍රෙක්ෂකයන්ට රඟ පා ඉදිරිපත් කිරීම සඳහා සකස් කරන ලද කථාන්දරයකි." - ක්ලේටන් හැමිල්ටන්
- "නාට්‍ය යනු කෙනකුගේ සිතෙහි පහළවන්නා වූ නිර්මාණශීලී ප්‍රපංචයකි. එය වචන ඔස්සේ සංවාදයට පෙරළී වේදිකාව මත ජීවය ලබයි." - ඇලඩයිස් නිකොල්
- "නාට්‍ය වනාහි කිසියම් කථා පුවතක් රංගනය ඇසුරුකොට ගෙන කලා මාධ්‍ය කිහිපයක් උපයෝගි කරගෙන ප්‍රේක්ෂක සහභාගිත්වය ඇති ව ඉදිරිපත් කෙරෙන සාපෙක්ෂ වශයෙන් ගතික වූ සාමූහික කලාවකි."

(ඉහත දැක්වෙන නිර්වචනයක් හෝ ඊට සමාන අදහසක් ලියා ඇත්නම් ලකුණු 02 යි)

ii. නාට්‍ය කලාවට සුවිශේෂී වූ ලක්ෂණ,

- නළු කේන්ද්‍රිය කලාවකි
- සෙසු කලාවන් ගෙන් පෝෂණය වන කලාවකි.
- සාමූහික කලාවකි
- සමෝධානිත කලාවකි
- නළු-නිළියන් විසින් ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවී අයුරින් කෙරෙන රඟ දැක්වීම.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර අනුව වෙනස් වීම
- සතර අභිනය ප්‍රධාන ප්‍රකාශන මාධ්‍යය වේ.

(මෙවැනි කරුණු 04 ක් සඳහා ලකුණු 04 යි)

iii තේමාව, නාට්‍යයේ ශෛලිය, චරිත හා සිදුවීම, ගැටුම් අවස්ථා, ආනුෂංගික අංග යනාදිය කෙරෙහි අවධානය යොමු කරමින් සිසුවා නරඹා ඇති නාට්‍යයක් පිළිබඳ ඇගැයීමක් කර ඇත්නම් එක් කරුණකට එක් ලකුණ බැගින් සමස්ත පිළිතුරට ලකුණු 06 යි)

| | |
|---|---|
| 4. (i) දේශීය ශාන්තිකර්ම **දෙකක්** නම් කරන්න. | (ලකුණු 02 යි) |
| (ii) ඉහත (i) හි නම් කළ එක් ශාන්තිකර්මයක අඩංගු නාට්‍යමය පෙළපාළි **හතරක්** සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) ඉහත (ii) හි සඳහන් කළ එක් නාට්‍යමය පෙළපාළියක ඇතුළත් වන නාට්‍යමය ලක්ෂණ මොනවා දැ යි උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. | (ලකුණු 06 යි) |

i. කොහොඹා කංකාරිය

දහ අටසන්නිය / සන්නි යකුම

ගම්මඩුව

දෙවොල් මඩුව

රට යකුම/ රිද්දියාගය

පහන් මඩුව

කිරි මඩුව

සූනියම් ශාන්තිය/ සූනියම් කැපීම

පූනා මඩුව

ගරා මඩුව

මහසොහොන් සමයම

(මේ අතරින් දෙකක් නම් කර ඇත්නම් ලකුණු 02 යි)

ii අපේක්ෂකයා නම් කර ඇති ශාන්තිකර්මයේ පෙළපාළි සංඛ්‍යාව සලකා එක් පෙළපාළියකට එක් ලකුණ බැගින් ලබා දෙන්න.


(ලකුණු 04 යි)

iii අනුකරණය, සමාරෝපය, අවස්ථා නිරූපණය, සංවාද භාවිතය, චරිත නිරූපණය අනුරූපණය, රංග භාණ්ඩ හා රංග භූමි භාවිතය, ප්‍රේක්ෂක සහභාගිත්වය ආදි නාට්‍යමය ලක්ෂණ ඇතුළත් පෙළපාළියක් උදාහරණ සහිත ව විස්තර කර තිබේ නම් සම්පූර්ණ ලකුණු ලබාදෙන්න.

(ලකුණු 06 යි)

| | |
|---|---|
| 5. (i) නාඩගම් රඟ දැක්වූ කරළියක රූප සටහනක් ඇඳ, එහි කොටස් හඳුන්වාදෙන්න. | (ලකුණු 02 යි) |
| (ii) පැරණි නාඩගම් ප්‍රචලිතව පැවති ප්‍රදේශ **හතරක්** නම් කරන්න. | (ලකුණු 04 යි) |
| (iii) නාඩගම් සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ මොනවා දැ යි විමර්ශනය කරන්න. | (ලකුණු 06 යි) |

i.




ii යාපනය, හලාවත, මීගමුව, කොළඹ, මොරටුව, වැලිගම, මාතර, තංගල්ල
යනාදී ප්‍රදේශ 04 ක් නම් කිරීම සඳහා
(ලංකාවේ බටහිර වෙරළ තීරයට අයත් වෙනත් නගරවල නම් ද සඳහන් කළ හැකි ය)

(ලකුණු 04 යි)

iii නාඩගම් සම්ප්‍රදායට ආවේණික ලක්ෂණ

- පූර්වරංගයක් තිබීම
- ස්ථාවර පාත්‍රයන් සිටීම ( බහුබූතයා,/කෝලමා/කෝණංගියා/සෙල්ලම් ළමා, බෙර වයන්නන්, අනාගතවක්තෘ සහ හඬ දූතයන්, පිළිවෙළින් කරළියට පිවිසීම අනතුරු ව රාජ සභාවේ ඇමතිවරුන් හා රජු ගේ සම්ප්‍රාප්තිය සිදු වීම සහ නාඩගමේ කතා පුවත රඟ දැක්වීම.
- දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතයේ රාගතාල අනුව ගීත හා සංගීතය නිර්මාණය වී තිබීම.
- තාල රහිත ගායනා සහ තාලානුරූපී සින්දු ඇතුළත් වීම.
- පාත්‍රවර්ගයා තානමකට අනුව ගමන් තාලයෙන් කරළියට පැමිණීම හා පිටවී යාම.
- විවිධ රස භාව උපදවන නාඩගම් තාල වාදනය කිරීම.
- පොතේ ගුරු හා ගායක කණ්ඩායම විසින් කථා පුවත හා චරිත හඳුන්වාදීම.
- නාඩගම් කතාව දින 7 - 3 අතර කාලයක් රඟ දැක්වීම.
- ගැහැනු චරිත ද පිරිමින් විසින් නිරූපණය කරනු ලැබීම.
- කිට්සන් පහන් ආලෝකකරණය සඳහා භාවිත කිරීම.
- වාද්‍ය භාණ්ඩ වශයෙන් හොරණෑව, මද්දලය, කයිතාලම, රවිකිඤ්ඤය යොදා ගැනීම
- නාට්‍ය ධර්මී ලක්ෂණ අන්තර්ගත වීම.
- පස් ගොඩකර සාදාගත් කරළිය මත රඟ දැක්වීම.

(මෙවැනි කරුණු 03 ක් සඳහන් කර ඇත්නම් ලකුණු 06 යි)

6. (i) පරාක්‍රම නිරිඇල්ල විසින් අධ්‍යක්ෂණය කරන ලද නාට්‍ය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) 'ජන කරළිය' යනු කුමක් දැ යි හඳුන්වා දී ඊට ආවේණික වූ විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට පරාක්‍රම නිරිඇල්ල ගෙන් සිදු වූ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 06 යි)

i. සෙක්කුව ,විනිශ්චය,ගැලීලියෝ ,උත්තමාවි ,වරෙන්තු ,චරන්දාස් ,මකරාක්ෂයා ,මැටිකරත්තය , හුණුවටය ,අන්දරමල් ,සීතාම්බරපට ,භාෂා සහ මොලී වෙන්කට්ටි ,වට්ටම්, පෝරි සාදයා , කොරා සහ අන්ධයා ,වට ඔලුවෝ සහ උල් ඔලුවෝ

(ඉහත සඳහන් නාට්‍ය දෙකක් නම් කර ඇත්නම් ලකුණු 02 යි)

ii. • ජන කරළිය යනු පරාක්‍රම නිරිඇල්ල සහ එච් .ඒ පෙරේරා ගේ මූලිකත්වයෙන් ආරම්භ කළ ජංගම කූඩාරම් රඟහලකි .

ජන කරළියට ආවේණික ලක්ෂණ

- කූඩාරමක් මෙන් තැනින් තැනට ගෙන ගොස් සවිකර නාට්‍ය පෙන්විය හැකි රඟහලක් ලෙස සාදා තිබීම.
- කූඩාරම මැද රංග භූමිය/ වේදිකාව සකසා ප්‍රේක්ෂකයන්ට හතර පැත්තක සිට නාට්‍ය නැරඹීමට හැකිවන පරිදි පඩි පේළියක ආකාරයට ආසන පනවා තිබීම.
- ප්‍රධාන තිර හෝ පැති තිර නොමැති වීම.
- නාට්‍ය රඟ දැක්වීමට නූතන ආලෝක උපකරණ සහ විදුලි පහන් භාවිත කිරීම.
- වහලය ලෙස ටෙන්ට් රෙද්දක් භාවිත කිරීම.
- පිට්ටනියක් වැනි විවෘත එළිමහන් භූමියක සවි කරන එරීනා රඟහලක ස්වරූපය ගැනීම.
- නාට්‍ය රඟ දැක්වීමට මෙන්ම නාට්‍යකරුවන් පුහුණු කරන වැඩමුළු සඳහා යොදා ගැනීම.

(ජනකරළිය හැඳින්වීමට ලකුණු 02 යි.)
(ඉහත දැක්වෙන ලක්ෂණ දෙකක් සඳහන් කිරීම සඳහා ලකුණු 02 යි.)

iii සිංහල නාට්‍ය කලාවේ ප්‍රගමනයට පරාක්‍රම නිරිඇල්ල ගෙන් සිදු වූ සේවය

- සෙක්කුව වැනි ස්වතන්ත්‍ර නාට්‍ය රචනා කොට අධ්‍යක්ෂණය කිරීම.
- පරිවර්තන නාට්‍ය දහයක් පමණ අධ්‍යක්ෂණය කිරීම.
- පරිවර්තන නාට්‍ය නිර්මාණ මගින් ලෝක ප්‍රකට නාට්‍යකරුවන්ගේ විවිධ නාට්‍ය ආකෘති රංග ශෛලී හා රූපණ විධික්‍රම මෙරටට හඳුන්වාදීම.
- ගාමිණී හත්තොටුවේගම මහතාගේ මූලිකත්වයෙන් ඇරඹුණු ලංකාවේ ප්‍රථම වීදි නාට්‍ය කණ්ඩායමේ සහාය නිෂ්පාදක සහ සංවිධායක ලෙස කටයුතු කිරීම.
- නාට්‍ය වැඩපළ (Workshop) පවත්වමින් කුශලතා පිරි නවක තරුණ නාට්‍ය ශිල්පීන් රාශියක් බිහි කිරීම.
- ජන කරළිය ආරම්භ කොට සිංහල හා දෙමළ නවක නළු-නිළියන් පුහුණු කොට සිංහල දෙමළ භාෂා මාධ්‍ය දෙකෙන්ම නාට්‍ය නිෂ්පාදන ඉදිරිපත් කිරීම.
- ජනකරළිය සංචාරක ජංගම රඟහල ඉදිකොට දුෂ්කර ප්‍රදේශවල ජනතාවට අඩු මුදලට නාට්‍ය නැරඹීමට අවස්ථාව සලසා දීම.
- ජනකරළිය අධ්‍යාපනය හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවහාරික රංග කලාවක් ලෙස යොදා ගැනීම.
- ජනකරළිය මගින් ප්‍රාදේශීය නාට්‍ය කණ්ඩායම් පුහුණු කිරීම කිරීම.
- විකල්ප නාට්‍ය කලාවක් සඳහා දායකත්ව සැපයීම
(විදී නාට්‍ය ජනකරළිය, සංවාද මණ්ඩප නාට්‍යය)

(මෙවැනි කරුණු 03 ක් විස්තර කොට ඇගයීමට ලක්කර ඇත්නම් ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන සේ නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

කොළඹ පැවැත්වෙන නාට්‍ය උළෙලක වේදිකාගත වන ළමා නාට්‍යයක් නැරඹීමට 11 ශ්‍රේණියේ සිසුන් රැගෙන යන බව ගුරුතුමා පන්තියේ දී දැනුම් දෙයි. සුනිල් ගෙදර පැමිණ අම්මාට පවසන්නේ නාට්‍ය නැරඹීමට යන එක් ළමයකු ගෙන් රු. 2000ක් එකතු කරන බව යි. මේය අසා තාත්තා කෝපයට පත් වෙයි. රැකියාවක් කරන සුනිල් ගේ ලොකු අයියාට අම්මා කියාසිටින්නේ නාට්‍ය බැලීමට කෙසේ හෝ මල්ලීට මුදල් සොයා දිය යුතු බව යි.

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා

(ලකුණු 04 යි)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)